[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

**මතුගම අධ්‍යාපන කලාපය**

# දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 7 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II | පැය - 2 යි. |

නම .......................................................................................................

**සැලකිය යුතුයි;**

- **ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

## I - පත්‍රය

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) බුදුරජාණන් වහන්සේ කළගුණ දැක්වීම වශයෙන් අනිමිස ලෝචන පූජාව සිදුකරන ලද්දේ කී වන සතියේදී ද ?
   - i. පළමුවන සතියේ දී ය.
   - ii. දෙවන සතියේ දී ය.
   - iii. තෙවන සතියේ දී ය .
   - iv. පස්වන සතියේ දී ය.

2) පෙර භවයක අකුසල කර්මයක් හේතුවෙන් මුලු ශරීරයේම කුෂ්ඨ වැළඳීමෙන් දුකට පත් ව බුදු රජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ භික්ෂූන් වහන්සේ නමකි.
   - i. ආනන්ද හිමි.
   - ii. සැරියුත් හිමි.
   - iii. මහා කාශ්‍යප හිමි
   - iv. පූතිගත්ත තිස්ස හිමි.

3) බුද්ධ රත්නය වන්දනා කරන ගාථාව වන්නේ,
   - i. ඉතිපිසෝ පාඨය ය.
   - ii. ස්වාක්ඛාතෝ පාඨය ය.
   - iii. සුපටිපන්නෝ පාඨය ය.
   - iv. කායේන වාචා චිත්තේන පාඨය ය.

4) "ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ..." යන පද්‍යය ඇතුළත් කෘතිය නම්,
   - i. බුදුගුණ අලංකාරය යි.
   - ii. ලෝවැඩ සඟරාව යි.
   - iii. ගුත්තිල කාව්‍යය යි.
   - iv. සිරිත් මල්දම යි.

5) කරණීය මෙත්ත සූත්‍රය තුළ ඇතුළත් වන්නේ,
   - i. බුදු ගුණ ය.
   - ii. මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණ ය.
   - iii. මංගල කරුණු ය.
   - iv. තුන් බිය දුරු කිරීමේ ගුණ ය.



LIVEWORKSHEETS

- **6 සිට 10 දක්වා ප්‍රශ්නවලට අදාළ වාක්‍ය කියවා බලා නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

6) බුදු සසුනේ අග්‍ර දායිකාව වන්නේ..........................................................................................යි.
(සුජාතා සිටු දේවිය / විශාඛා සිටු දේවිය / කිසා ගෝතමිය)

7) ධම්ම පදය අයත් වන නිකාය..........................................................................................නිකාය යි.
(ඛුද්දක / අංගුත්තර / සංයුක්ත)

8) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ..........................................................................................ය.
(පන්සිල් / අටසිල් /ආජීව අෂ්ටමක සීලය)

9) සිගාලෝවාද සූත්‍රයේ ගුරුවරුන්ව උපමා කර ඇත්තේ..........................................දිශාවට ය.
(උතුරු / නැගෙනහිර / දකුණු)

10) බුද්ධ කාරක ධර්ම යනුවෙන් හඳුන්වන්නේ..........................................................................ය.
( දස පාරමිතා / චතුරාර්ය සත්‍යය /ආර්ය අෂ්ටාංගික මාර්ගය)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල "අ" කොටසට අදාළ පිළිතුර "ආ"කොටසින් තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

| "අ" කොටස | "ආ" කොටස |
|---|---|
| 11) ඉවසීම ප්‍රගුණ කළ හිමිනමකි. | (...........) 1. පළමු දේවාචික උපාසකවරු ය. |
| 12) අග්‍ර ශිෂ්‍ය දානය, | (...........) 2. අන්‍යෝන්‍ය උපකාරය, සහයෝගය යි. |
| 13) මැනවින් ඉගැන්වීම. | (...........) 3. පුණ්ණ තෙරණුවන් |
| 14) සහජීවනය යනු, | (...........) 4. අලුත් බත් සකසා පූජා කිරීම ය. |
| 15) තපස්සු භල්ලුක | (...........) 5. ගුරුවරයාගේ යුතුකමකි. |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

16) අකුසලයෙන් වෙන්වීම.......................................................................... ලෙස හඳුන්වයි.

17) පිසුණාවාචා වේරමණී යන ශික්ෂා පදය.............................. වැළකීම යන අදහස ගෙන දෙයි.

18) මැනවින් හික්මවීම...................................................................විසින් ඉටුකරන යුතුකමකි.

19) ඉවසීමෙන් ලැබෙන්නේ..........................................................................................ය.

20) සිංහලයන් ගේ ආගන්තුක සත්කාරය පිළිබඳ ...............................................තම ප්‍රශංසාව පළකර ඇත.
(රොබට් නොක්ස් /ගුරුවරු /සැනසීම /විරතිය / කේලාම් කීමෙන් /ශිෂ්‍යයින්)



LIVEWORKSHEETS